ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම්වලින් මුදල් ගෙවීම් රු.997,000ක් වුව ද, එය රු.474,536ක් ලෙස රු.522,464ක් අඩුවෙන් ද, හරස් සටහන් මගින් ගෙවීම් භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව රු.474,536ක් වුව ද, එය රු.997,000ක් ලෙස රු.522,464ක් වැඩියෙන් ද, මූල්‍ය ප්‍රකාශනවල ACA-5 ආකෘතියෙහි දක්වා තිබුණි.	අත්තිකාරම් “බී” ගිණුම්වලින් මුදල් ලැබීම රු.997,000 වුව ද, එය හරස් සටහන් මගින් ලැබීම්වල අගය වන රු.474,536 ලෙස වැරදීමකින් සටහන් වී ඇත. හරස් සටහන් මගින් ලැබීම රු.474,536 විය යුතු අගය වැරදීමකින් එසේම මුදල් ලැබීම්වල අගය වන රු.997,000 ලෙස සටහන් වී ඇති බව දන්වා තිබුණි.	භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව අත්තිකාරම් ගිණුම් ශේෂය ACA-5 ආකෘතියෙහි සටහන් කළ යුතු ය.
(ii)	භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව අත්තිකාරම් ගිණුමට වර්ෂය තුළ මුදලින් බැරකිරීම් රු.985,210ක් වුව ද, රු.218,000ක් ලෙස රු.767,210ක් අඩුවෙන් ද, හරස් සටහන් මගින් ලැබීම් භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව රු.218,000ක් වුව ද, රු.985,210ක් ලෙස රු.767,210ක් වැඩියෙන් ද, මූල්‍ය ප්‍රකාශනවල ACA-5 ආකෘතියෙහි දක්වා තිබුණි.	මුදලින් බැරකිරීම් රු.985,210ක් විය යුතු අගය හරස් සටහන් මගින් ඇති අගය වන රු.218,000 ලෙස ද, හරස් සටහන් මගින් ලැබිය යුතු අගය වන රු.218,000 වෙනුවට මුදලින් බැරකිරීමේ අගය වන රු.985,210 ලෙස වැරදීමකින් සටහන් වී ඇති බව දන්වා තිබුණි.	භාණ්ඩාගාර මුද්‍රිත SA-52 අනුව අත්තිකාරම් ගිණුම් ශේෂය ACA-5 ආකෘතියෙහි සටහන් කළ යුතු ය.

(ආ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් රු.1,177,100ක් වුව ද, එය මූල්‍ය ප්‍රකාශනවල ACA-3 ආකෘතියෙහි දක්වා නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වෙනත් මූලාශ්‍ර මගින් අග්‍රිම ලැබීම් රු.1,177,100 යි.	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව අග්‍රිම ශේෂය ACA-3 ආකෘතියෙහි සටහන් කළ යුතු ය.
(ii)	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව වියදම් මගින් අග්‍රිම පියවීම රු.68,240,878ක් වුව ද, එය රු.67,112,925ක් ලෙස රු.1,127,953ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ACA-3 ආකෘතියෙහි දක්වා තිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වෙනත් මූලාශ්‍ර මගින් ලැබීම් රු.1,177,100 භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් රු.67,757,000 සමග මුළු එකතුව රු68,934,100ක් වන අතර, අග්‍රිම පියවීම්හි වියදම රු.68,240,878ක් හා මුදල් මගින් පියවීම් රු.644,075 වන ලෙස සංශෝධනය විය යුතු යි.	භාණ්ඩාගාර මුද්‍රිත SA-71 අනුව අග්‍රිම ශේෂය ACA-3 ආකෘතියෙහි සටහන් කළ යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 13ක හා මූලධන වැය විෂයන් 03ක ප්‍රතිපාදිත රු.62,610,000කින් රු.11,718,665ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 10 සිට සියයට 71ක පරාසයක් දක්වා විහිදී තිබුණි.	2026 වර්ෂයේ අයවැය සකස් කිරීමේ දී තථ්‍ය තොරතුරු මත පදනම්ව අයවැය සකස්කරන බව දන්වා තිබුණි.	සකසුරුවම් හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමුකරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

(ආ)	231–1–1–0–1003-11 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.2,330,000ක් වෙන්කර ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට එසේ වෙන්කරන ලද වටිනාකම සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයේ ප්‍රතිපාදනවල මුළු ඉතිරිය රු.4,921,627ක් වී තිබුණි. 2024 මාර්තු 26 දිනැති ණය සහනදායක මණ්ඩලයේ ලේකම් විසින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ අංක DCB/AC/03/06/2024 ලිපිය අනුව රු.10,000ක ජීවන වියදම් දීමනා ගෙවීම සඳහා පවතින ප්‍රතිපාදන සමග අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් පරිපූරක ඉල්ලීම්කර තිබුණි.	2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත අමතරව ලද ජීවන වියදම් දීමනාව රු.2,330,300 වන අතර, මෙම අමතර ප්‍රතිපාදන ප්‍රමාණය දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකින් තොරව පොදු චක්‍රලේඛයක් මගින් දෙපාර්තමේන්තුව වෙත ලද ප්‍රතිපාදනයකි. (රා.ප.ච අංක 03/2024) අමාත්‍යාංශය පොදුවේ අමාත්‍යාංශය යටතේ දී ඇති දෙපාර්තමේන්තුවල අමතර ප්‍රතිපාදන අවශ්‍යතාවය ගණනය කිරීමේ දී සේවක සංඛ්‍යාව සමග ජීවන වියදම් දීමනාව ලබාදීම සඳහා ප්‍රතිපාදන ඉල්ලීම්කර ඇත. පසුව තුන්වන කාර්තුව අවසානයේ දී ජීවන වියදම් ගෙවීම සඳහා අමතර ප්‍රතිපාදන නොගෙන පවතින ප්‍රතිපාදන මගින් කළමනාකරණයකර ගැනීමට හැකි බවට දන්වමින් ලිපියක් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රතිපාදන ඉල්ලීම් කළ යුතු ය.
(ඇ)	231-1-1-0-1101-11 වැය විෂයෙහි ඉතිරිවීම් සියයට 67ක් වූ අතර, ශාඛා කාර්යාල පිහිටුවීම මත කාර්යයන් විමධ්‍යගත වීම නිසා ගමන් වියදම් අවමවීම ලෙස ඉතිරිවීම්වලට හේතු දක්වා තිබුණ ද, 2024 වර්ෂය තුළ ශාඛා කාර්යාල පිහිටුවීමට කටයුතුකර නොතිබුණි. අවසන්වරට ශාඛා කාර්යාල පිහිටුවා තිබුණේ 2022 වර්ෂයේ බැවින් මෙම හේතුව විගණනයට පිළිගත නොහැකි විය.	ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරියෙකු දැනට අනුමත සේවක සංඛ්‍යාව තුළ නොසිටීමෙන් මෙම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි විය. 2026 වර්ෂයේ අයවැය සකස්කිරීමේ දී තථ්‍ය තොරතුරු මත පදනම්ව අයවැය සකස්කරන බව දන්වා සිටිමි.	ප්‍රතිපාදනවල ඉතිරිවීම් සඳහා නිවැරදි හේතු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඈ)	231-1-1-0-1404-11 වැය විෂයෙහි රු.2,068,000ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 14ක ඉතිරිවීම් සඳහා ශාඛා මණ්ඩල පිහිටුවීම ප්‍රමාදවීම ලෙස හේතු දක්වා තිබුණ ද, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට නව ශාඛා මණ්ඩල ස්ථාපිත කිරීම ඇතුළත්කර නොතිබුණි.	2024 වර්ෂයේ අයවැය මගින් ශාඛා මණ්ඩල ස්ථාපිත කිරීම සඳහා මුදල් ලබා දී නොතිබුණු බැවින්, ක්‍රියාකාරී සැලැස්මට නව ශාඛා මණ්ඩල ස්ථාපිත කිරීම ඇතුළත් වී නොතිබුණි. 2026 වර්ෂය අයවැය සකස්කිරීමේදී තථ්‍ය තොරතුරු මත පදනම්ව අයවැයක් සකස් කරන බව දන්වා සිටිමි.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

(ඉ)	231-1-1-0-1506-11 වැය විෂයෙහි රු.71,360ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 71ක ඉතිරිවීම් සඳහා දේපළ ණය ලබාගත් නිලධාරින් දෙපාර්තමේන්තුව තුළ අවමවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම ලෙස හේතු දක්වා තිබුණ ද, 2023 වර්ෂයේ ද මෙම වැය විෂයෙහි ඉතිරිවීම්වලට හේතුව ලෙස ඉහත කරුණම දක්වා තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.	ස්ථාන මාරු වී යනු ලබන නිලධාරීන් සඳහා පැමිණෙන නිලධාරීන්ගේ දේපළ ණය ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂාවෙන් මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලීම්කර තිබුණි. 2026 වර්ෂය අයවැය සකස් කිරීමේ දී තථ්‍ය තොරතුරු මත පදනම්ව අයවැය සකස්කරන බව දන්වා සිටිමි.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඊ)	231-1-1-0-2401-11 වැය විෂයෙහි රු.135,500ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 34ක ඉතිරිවීම් සඳහා පුහුණු ආයතන මගින් පුහුණු වැඩසටහන් අනපේක්ෂිත අයුරින් 2025 වර්ෂයට කල්තබා ඇති බව හේතු ලෙස දක්වා තිබුණ ද, කාර්යමණ්ඩල පුහුණු කිරීම් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි.	පවතින ප්‍රතිපාදන උපරිම උපයෝජනයකර ගැනීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා වැය විෂයන්ගෙන් මාරුකරමින් අදාළ කාර්ය සඳහා යොදාගන්නා ලදී.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	2019 අංක 04 දරන ණය සහනදායක (සංශෝධන) පනත				
	(i) 1(1) වගන්තිය	-	ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයන් 11දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, සාමාජිකයන් 09දෙනෙකුට පමණක් මණ්ඩලය සීමා වී තිබුණි.	රජයේ ප්‍රතිපාදන අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු නිසා ප්‍රධාන මණ්ඩලයට සාමාජිකයන් 05ක් පමණක් පත්කර ඇත. එම නිලධාරින් මගින් එම කාර්ය කළ හැකි නිසා පත්කිරීම් කර නැත.	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

	(ii) 8(3) වගන්තිය	994,500	නීතිඥවරයෙකු ලෙස අවුරුදු 10කට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් මණ්ඩල සාමාජිකයන් සමන්විත විය යුතු වුව ද, එයට පරිබාහිරව ගාල්ල ශාඛා මණ්ඩලයට එක් සාමාජිකයෙකු පත්කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සාමාජික දීමනා, ගමන් වියදම් දීමනා හා ඒකාබද්ධ දීමනා ලෙස එකතුව රු.994,500ක් ගෙවා තිබුණි.	2019 අංක 4 දරන පනත යටතේ සාමාජිකයන් පත් කිරීම සඳහා බලතල ඇත්තේ ගරු අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙතයි. එම පත්කිරීම පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැක්කේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයෙනි.	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය	1,909,000	සභාපතිවරයා සහ මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම තම නිවසින් බැහැරව නිල කාර්යයක යෙදී සිටින විට ඔහුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි 12 වැනි වගන්තිය ප්‍රකාරව රු.500ක ඒකාබද්ධ දීමනාවක් ගෙවිය යුතු ලෙස සඳහන් වුව ද, උක්ත චක්‍රලේඛය පරිදි සංයුක්ත දීමනා ගෙවීමේ දී ආයතන සංග්‍රයේ XIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව මණ්ඩලයේ සාමාජිකයන් පැමිණීමේ සහ පිටවීමේ වේලාව සටහන්	මෙම සංයුක්ත දීමනාව ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගන්නා ලෙස රාජ්‍ය විගණන අංශයෙන් අප වෙත උපදෙස් ලැබුණු අතර, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් විමසීම් කිරීමට නිශ්චිත අංශයක් හඳුනාගත නොහැකි බැවින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා යවන ලදී. එහිදී අදාළ අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත්කළ අමාත්‍යාංශයෙන් උපදෙස් ලබාගන්නා ලෙස උපදෙස් ලැබුණු අතර, ඒ අනුව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා	යොමුගත චක්‍රලේඛය හා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

		නොකරන බැවින්, කොපමණ කාලයක් කාර්යයේ නිරත වූවා ද යන්න තහවුරුකර ගැනීමකින් තොරව රු.1,909,000ක මුදලක් ඒකාබද්ධ දීමනා ලෙස ගෙවීම්කර තිබුණි.	අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා යවා ඇත.	
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 හා 5.4.12 වගන්ති	වැට්බදු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ට වැට්බදු ආවරණය කිරීමට මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්විය යුතු වුව ද, ගෙවීම් පිළිබඳ විස්තර එසේ එවා නොතිබුණි.	අප දෙපාර්තමේන්තුව මෙතෙක් වැට් බදු සඳහා ලියාපදිංචි වී නොමැති බැවින්, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු තථ්‍ය නඩු සංඛ්‍යාව 745ක් වූ අතර, එය වර්ෂය තුළ විසඳීමට තිබුණු 2,058ක් වූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 36ක අගයක් ගෙන තිබුණි. මේ තුළ ප්‍රධාන මණ්ඩලයේ නඩු 109ක් ද, කොළඹ ශාඛාවේ නඩු 113ක් ද, ගම්පහ, කුරුණෑගල සහ ගාල්ල ශාඛා කාර්යාලවල නඩු සංඛ්‍යාව පිළිවෙලින් 293ක්, 154ක්, සහ 76ක් ලෙස ඉතිරි වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව හා සැසඳීමේ දී 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි නඩු	අප දෙපාර්තමේන්තුවේ පසුගිය වසරේ ස්ථිර ලඝුලේඛිකාවන් නොමැති නිසා කාර්මික විද්‍යාලවලින් අභ්‍යාසලාභීන් ලෙස බඳවාගත්තත් එම ලඝු ලේඛිකාවන් දිනපතා පැමිණීමේ දුර්වලතාවයක් තිබුණි. අප දෙපාර්තමේන්තුවේ සේවය කරන සංවර්ධන නිලධාරීන් විසින්ම එම කාර්යය ද සිදුකරන ලදී. ලඝු ලේඛනය එම නිලධාරීන්ට පුරුදු කාර්යයක් නොවන නිසා කාර්යක්ෂමතාව අඩු නිසාත් විභාග	නඩු විසඳීමට කඩිනමින් පියවර ගත යුතු ය.

	සංඛ්‍යාවෙහි වැඩිම ප්‍රතිශතය ගම්පහ ශාඛාවෙන් වූ අතර, එය සියයට 50ක අගයක් ගෙන තිබුණි.	නඩු සාක්ෂි ප්‍රමාද විය. ඒ හේතුවෙන් නඩු විසඳීම සහ විභාග කිරීම කාර්යක්ෂමව සිදුනොවී ය. එවැනි බාධා තිබිය දී ද සියයට 64ක ප්‍රගතියක් පෙන්වා තිබුණි.	
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට විභාග වන නඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද කාලවිශ්ලේෂණයට අනුව අවුරුදු 03ත් 05ත් අතර නඩු සංඛ්‍යාව 100ක් ද, අවුරුදු 05ත් 10ත් අතර විභාග වන නඩු සංඛ්‍යාව 113ක් හා අවුරුදු 10ට වැඩි විභාග වන නඩු සංඛ්‍යාව 17ක් ලෙස පැවතුණි. ඒ අනුව වසර 03ට වැඩි කාලයක සිට නොවිසඳා තිබුණු නඩු සංඛ්‍යාව 230ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු 959ක් වූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 24ක අගයක් ගෙන තිබුණි.	2025 ජනවාරි 27 දින ලඝුලේඛක තනතුර සඳහා බඳවාගැනීම් සිදු කරන ලදී. ඒ අනුව 2025 වර්ෂයේ දී කාර්යක්ෂමතාව වැඩි කිරීමට කටයුතු කරමින් පවතී.	නඩු විසඳීමට කඩිනමින් පියවර ගත යුතු ය.
(ඇ)	2009 වර්ෂය දක්වා භාරගන්නා ලද මෙතෙක් නොවිසඳුණු නඩු 06ක් 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණු අතර, වසර 15කට අධික කාලයක සිට නොවිසඳී පැවත එන නඩු මේ තුළ පැවතුණි.	2025 අප්‍රේල් 22 වන විට නොනිමි නඩු 05ක් ඉතිරි වී ඇත.	කල්ගත වූ නඩු විසඳීමට කඩිනම් පියවරගත යුතු ය.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ නියමිත දින ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඩෙස්ක්ටොප් යන්ත්‍ර 04ක් මිලදීගැනීම සඳහා තෝරාගත් ආයතනන 05කින් මිලගණන් කැඳවා තිබූ අතර, ආයතන 03ක් පමණක් මිලගණන් ඉදිරිපත්කර තිබුණි. පිරිවිතරයට අනුව Processor අවශ්‍යතාවය Intel Core i3 – 12^{th} Gen or i5 ලෙස සඳහන්කර තිබුණ ද, තෝරාගත් සැපයුම්කරු Processor i3 සහ i5 සඳහා මිලගණන් ඉදිරිපත්කර තිබූ අතර, ඉතිරි ලංසුකරුවන්ගේ ලංසුවල සඳහන්කර තිබූ Processor වර්ගය i3 ද, i5 ද යන්න විගණනයේ දී පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි විය.	ඩෙස්ක්ස්ටොප් යන්ත්‍ර 04 මිලදී ගැනීම සඳහා ආයතනවලට අප විසින් යවන ලද පිරිවිතරයේ i3 හා i5 වශයෙන් වර්ග දෙකක් සඳහන් කර ඇත. එහෙත් එක් ආයතනයකින් පමණක් i3 හා i5 වෙන් වෙන් ලෙස සඳහන්කර තිබුණ ද, අනෙක් ආයතන දෙකෙන් i3වල පමණක් මිලගණන් එවා තිබුණි. මෙම ගැනුම්පත් සියල්ල තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, එම කමිටුව විසින් i3 අඩුම මිල ගණන් යටතේ මිලදීගැනීමට නිර්දේශකර තිබුණි. ඩෙක්ස්ටොප් පරිගණක ලංසු ලෙස i3 වෙනුවෙන් ලංසුකරුවන් තුන්දෙනෙකු ඉදිරිපත්කර ඇති නිසා එම පදනම මත core i5 නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර අනුව ගැළපෙන අවම මිල සහිත ලංසුව තෝරාගන්නා ලදී.	නිවැරදිව ලංසු ඉදිරිපත් කිරීමට ලංසුකරුවන් උනන්දු කිරීම.
(ආ)	ශාඛා කාර්යාල සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 03ක් රු.195,000ක වියදමක් දරා මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ආ) වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, 2024 ජනවාරි 31 දින පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව එකී කොන්දේසි සපුරා නොතිබුණි. තව ද, මිලගණන් කැඳවීමට ලිපි යැවීමෙන් පසුව එනම්, 2024 පෙබරවාරි 13 වන දින වෙනත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් පත්කර තිබුණු අතර පිරිවිතර පිළියෙල කිරිමේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා ලබාදෙන වගකීම් කාලය පිළිබඳව අවදානය යොමුනොකර පිරිවිතර පිළියෙලකර තිබුණි.	මෙම දෙපාර්තමේන්තු සඳහා එම වර්ෂයට තාක්ෂණික කමිටුවක් අමාත්‍යාංශයෙන් පත්කර තිබුණි. ඔවුන් විසින් තාක්ෂණික ඇගයීම් සිදුකර වාර්තාවක් නිකුත්කරන ලදී. මෙහි දී 2024.01.31 දිනැති ලිපිය අහෝසි වන අතර 2024.02.13 ලිපිය බලාත්මක වේ. වගකීම් කාලයක් වසර 03ක් ලෙස ලංසුව පිරිනමන ලද ආයතනයෙන් ලබා දී ඇත. ඉදිරියේ දී පිරිවිතරය සඳහා වගකීම් කාලය සටහන් කිරීමට කටයුතු කරනු ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම.

4.4 රජයේ නිලධාරින් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරින් ද, රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇපආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරින් 15දෙනෙකු ඇප තබා නොතිබුණි.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබීම සඳහා ඇප තැබීමේ ලේඛන අවශ්‍ය කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත 2024 සැප්තැම්බර් 25 වන දින යොමුකර ඇතත්, එම ලේඛනවල අඩුපාඩු සහිත බැවින් නැවත අප දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. එම ලේඛන අඩුපාඩු සකස්කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු ය.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජූනි මාසයට අදාළ ජල බිල්පත් වටිනාකම රු.86,046ක් වී තිබූ අතර, එවැනි අසාමාන්‍ය වටිනාකමක් ඉදිරිපත් වුව ද, ඒ පිළිබඳ සොයා බලා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය හේතු කොට ගෙන 2024 ජූලි මාසය සඳහා ද, රු.86,046ක අසාමාන්‍ය බිල්පත් වටිනාකමක් ඉදිරිපත් වී තිබුණි. ජූලි මාසයේ නව ජල මාපාංකයන් සවිකර තිබිය දී කුරුණෑගල ශාඛා කාර්යාලයේ අගෝස්තු සිට නොවැම්බර් දක්වා වූ මාස 04 සඳහා ද, වටිනාකම රු.62,634ක් වූ ජල බිල්පත් වෙනුවෙන් කුරුණෑගල මහනගර සභාව වෙත ගෙවීම්කර තිබුණි. මෙම වටිනාකම සමාලෝචිත වර්ෂයේ පළමු මාස 6 හා සැසඳීමේ දී ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.	කුරුණෑගල මහනගර සභාව විසින් 2024 ජූනි මාසයේ සිට නොවැම්බර් දක්වා කාලයට අදාළ සියලු බිල්පත් එකවර 2024 නොවැම්බර් මාසයේ දී නිකුත්කර ඇත. එහි දී 2024 ජූනි මාසයට අදාළ බිල්පත සඳහා ගෙවිය යුතු මුදලේ අගය අසාමාන්‍ය ලෙස වැඩි බව නිරීක්ෂණය විය. බිල්පත් ප්‍රමාදවීම සම්බන්ධවත්, බිල්පතේ අගය වැඩිවීම සම්බන්ධවත්, යන කුරුණෑගල මහනගර සභාව වෙතින් 2024.12.19 විමසූ අතර, 2024.12.30 දින පිළිතුරු ලැබී ඇත. එම වාර්තාවට අනුව නිරීක්ෂණය වූයේ මනුවේ දෝෂයක් නොවන බවත්, අභ්‍යන්තර ජලකාන්දුවක් හේතුවෙන් ජල බිල්පත වැඩි වී ඇති බවත් ය.	බිල්පත් ප්‍රමාදවීමේ දී විෂය ලිපිකරු ඒ පිළිබඳව සොයා බලා කඩිනමින් නියමිත දිනට බිල්පත් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, අභ්‍යන්තර දෝෂ නිවැරදි කිරීමට කඩිනමින් පියවර ගැනීමට වගබලා ගත යුතු ය.

(ආ)	කුරුණෑගල ශාඛා බලප්‍රදේශයට දිවයිනේ අධිකරණ බලප්‍රදේශ 34න්, 14ක කාර්යයන් පැවරී තිබුණ ද, 2024 වර්ෂය සඳහා ණය නිරවුල්කර දෙන ලෙසට වූ ඉල්ලීම් සම්බන්ධ අයදුම්පත් 160ක් ඉදිරිපත් වී තිබූ අතර, දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය අඩුවීම මත දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීමට අයදුම්පත් ඉදිරිපත්වීමේ අඩුවක් ඇති බව මේ අනුව නිරීක්ෂණය වේ. වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 09ක් සිදුකර තිබුණ ද, ඉහත ප්‍රදේශ ඉලක්කකර ගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මකකර නොතිබුණු අතර, දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත්කර නොතිබුණි.	කුරුණෑගල අධිකරණ බලසීමාවට ප්‍රදේශ කිහිපයක් අයත් වුව ද, ඒවා බොහෝමයක් රජයේ ඉඩම් සහිත අධිකරණ බලසීමා වේ. රජයේ ඉඩම් සඳහා නඩු වාර්තාවීම අඩු නිසා, නඩු අවස්ථා අඩුවේ. දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ඉල්ලා ඇති ප්‍රතිපාදන අප වෙත නොලද බැවින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවිණි.	ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු අතර, ප්‍රමාණවත් පරිදි දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදුකළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් ගණකාධිකාරී තනතුර 2021 මාර්තු 17 වන දින සිට පුරප්පාඩුව පවතින අතර, අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් මෙම තනතුරෙහි වැඩබැලීම සිදුකරනු ලබයි. වැඩබැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.187,263ක් ගෙවා තිබුණි.	අප දෙපාර්තමේන්තුවේ ඇති ගණකාධිකාරී පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත්කර ඇත. ගණකාධිකාරීවරු බඳවාගැනීම් නොකළ හෙයින් අප දෙපාර්තමේන්තුව වෙත ගණකාධිකාරී තනතුරෙහි පුරප්පාඩුව පුරවා නොමැත.	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 18ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 16ක් වූයෙන් පුරප්පාඩු 02ක් පැවති අතර, කළමනාකරණ සේවා තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව	2025 ජනවාරි 27 දින මෙම පුරප්පාඩු සම්පූර්ණකර ඇත.	පුරප්පාඩු නියමිත දිනයන්ට සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය.

15ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06ක් වූයෙන් පුරප්පාඩු 09ක් පැවතුණි. තව ද, ලඝුලේඛක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාවක් නොමැති හෙයින් එම තනතුර සම්පූර්ණයෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී තිබුණි.